

ගොවිතැනට අතදෙන මිනිස්සු

# ගොවි දැනුමට විදු දැනුම එක්කළ විද්‍යාඥයා

ජනතාවට අවශ්‍ය ආකාරයට සංවර්ධන රටාවන් සකස් කිරීම, පර්යේෂණවලට ජනතාව සහභාගීකර ගැනීම වැනි වචන අද ලෝකයේ රාජ්‍ය තාන්ත්‍රිකයින්ගේත් ප්‍රතිපත්ති සම්පාදකයන්ගේත් එදිනෙද ශබ්ද කෝෂයේ ඇති නිත්‍ය වචන බවට පත්වී තිබේ.

මේ මහඟු සත්‍ය තේරුම්ගෙන මෙයට වසර ගණනාවක් තිස්සේ සිට එම ධර්මතාවය නිහඬව ක්‍රියාත්මක කරන ලාංකික පුත්‍රයන් අප අතර වෙයි. වසර දශක තුනක් තිස්සේ එබඳු නිහඬ සේවයක යෙදෙන ලංකා පුත්‍රයෙකු වෙනුවෙන් මෙම ලිපිය වෙන්වෙයි.

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික පර්යේෂණ කටයුතු අධ්‍යයන කරන විද්‍යාඥයන්ගෙන් නිතැතින් පැසසුම් ලබන එක් නියත අංශයක් ඇත්තේය. එය වෙනත් බොහෝ රටවල නැති ශ්‍රී ලංකාව වැනි රටවල් කීපයකට පමණක් සුවිශේෂවූ ලක්ෂණයකි. ඒ අපේ පර්යේෂණ කටයුතු අපේ සාමාන්‍ය ගොවී මහතාගේ දැනුමට හා අවශ්‍යතාවයට ගැලපෙන හා අවශ්‍යවන ආකාරයට සැකසී තිබීමයි. මෙයට දශක කීපයකට පෙර විද්‍යාගාරවල මුළුගැන්වී. ගොවියාගෙන් අදත් සිදුකෙරුනු "ගොවිකම් පර්යේෂණ" ගොවියාගේ අවශ්‍යතාවය අනුව, ගොවියාගේ කුඹුරේදී බොහෝවිට ගොවියා මගින්ම කෙරෙන ආකාරයට වෙනස් වූයේ නැතහොත් වර්ධනය වූයේ වසර දශක ගණනාවක් තිස්සේ එක් පුංචි මිනිසකු විසින් දරණ ලද යෝධ වෑයම නිසාය.

# "කෘෂිකර්මය

# ජන්ම දායාදයක්"



ගතින් පුංචි වුවද හැකියාවෙන්, දැනුමෙන් හා සේවාවෙන් දෙස්-විදෙස් අතර අනභිභවනීය කීර්තියක් දරණ මොහු ආචාර්ය සී. ආර්. පානබොක්කේය. මේ පුංචි දිවයිනට සේවය කිරීම මිස තනතුරු ගැන තැකීමක් නොකරන ඔහු කෘෂිකර්ම පර්යේෂණ පිළිබඳ ශ්‍රී ලංකාවේ බලධරයෙක් වෙයි. කෘෂිකර්ම අධ්‍යක්ෂ පදවිය දැරූ හේ දැන් කෘෂිකර්ම සංවර්ධන හා පර්යේෂණ අමාත්‍යාංශයේ උපදේශක වරයෙකි. කෘෂි-පාංශු විද්‍යාඥයෙක් ලෙස ලෝක පූජිතව සිටින හේ සිටිය විශේෂඥතාවයට තිලින වශයෙන් කෘෂි පාංශු විද්‍යාව පිළිබඳ ලෝකයේ උත්තරීතර මණ්ඩලය වන අන්තර් ජාතික පාංශු පර්යේෂණ මණ්ඩලයේ පාලක මණ්ඩලයට පත්වීම ලද්දේය.

මෙරට කෘෂිකර්ම ක්ෂෙත්‍රයෙහි අභිවෘද්ධිය සඳහා විස්කම් සේවාවක් කළ ඔහුට කෘෂිකර්මය ජන්ම දායාදයක් විය. සුප්‍රකට පානබොක්කේ පරපුරට අයත් 1848 දී නිර්මාණය කරන ලදුව තවමත් පවතින බුසල් 200 ක් තැන්පත් කළ හැකි වී බිස්ස එම දායාදය සපථ කරවයි. ඔහුගේ පාසැල් සමයේ එළඹි, ලෝක යුද්ධයේදී ඇතිවූ ආහාර හිඟය කෘෂිකර්මය දෙසට තවත් නැඹුරු කරවන්නට හේතුවීම පුදුමයක් නොවේ.

ත්‍රිකෝණමළ සර්ප උඩරට සුප්‍රකට විද්‍යාල දෙකකින් අධ්‍යාපනය ලද ඔහුගේ අධ්‍යාපනයේ මුල් තේරීම වූයේ ඉංජිනේරු විද්‍යාවයි. සිවිල් ඉංජිනේරු වරයෙකු වීමේ අධ්‍යාපනය වසරක් පමණ හැදෑරූවත්, අසහාය කෘෂි විද්‍යාඥයෙකු බිහිකිරීමේ වාසනාව ලක්මාතාවට තිබූ නිසාදෝ ඔහු ඉන් බැහැරවී රසායන විද්‍යාව හැදෑරීය අපේ පාරම්පරික වෛද්‍ය විද්‍යාව වන ආයුර්වේද යේ රසායනික ස්වභාවයන් පිළිබඳව පර්යේෂණ යක් කරමින් ඔහු විශ්ව විද්‍යාල අධ්‍යාපනය අවසන් කළේ රසායන විද්‍යාව පිළිබඳ පළමු පන්තියේ ගෞරව උපාධියක් ලබමිනි.

# "ජනතා අවශ්‍යතා වලට ගැලපෙනසේ පර්යේෂණ කළ යුතුයි"



විශ්ව විද්‍යාලයෙන් පිටවූ මෙම තරුණ විද්‍යාඥයා පර්යේක්ෂකයකු ලෙස කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට බැඳුනේය. පසුකලෙක කෘෂිකර්ම අධ්‍යක්ෂධූරයට පත්වූ මෙරටේ කෘෂිකර්ම දියුනුවට විශිෂ්ඨ සේවාවක් කළ ආචාර්ය අර්නස්ට් අබෙරත්න යටතේ මහඉලුප්පල්ලම පර්යේෂණායතනයේදී මුළු රජරටම කෘෂිකර්ම දියුණුවට ආධාරවන පර්යේෂණ රාශියක් සිදු කිරීමට ඔහුට හැකියාව ලැබුනේය. වී හැරුනු විට, අතිරේක බෝග, උක්, වැනි විවිධ බෝග වර්ගද හේන් ගොවිතැන වැනි විවිධ ගොවිතැන් හා දේශගුණික තත්වයන්ද, පිලිබඳව මෙම පර්යේෂණ විහිදී ගියේය. පස් වසරක් තුළ විවිධ කෘෂි පර්යේෂණ යෙදී සිටියදී සිය පශ්චාත් අධ්‍යාපනය සඳහා එතෙර යාමට ඔහුට සිදුවිය, ලෝකප්‍රකට, ඕස්ට්‍රේලියාවේ ඇඩිලේඩ් විශ්ව විද්‍යාලයෙන් පාංශු විද්‍යාව පිළිබඳ විද්‍යාපති උපාධිය ඔහු ලද්දේය.

පශ්චාත් උපාධිය ලබා මෙරට පැමිණීමෙන් පසු, ඔහුගේ පර්යේෂණ කටයුතුවල ස්වර්ණ කාලය එළඹියේය පාංශු විද්‍යාව පිළිබඳව වැඩි අවධානයක් යොමුකළ ඔහු හේන් ගොවීන්ගේ ප්‍රශ්න පිළිබඳව පාංශු විද්‍යාත්මක පර්යේෂණයක් නිම කලේ එම අංශයේ පර්යේෂණ, විසිමත් ස්ථාපිත බවට පත්කරමිනි.

ඉන් අනතුරුව, මෙරටේ තිබූ විශාලතම අඩුවක් සපිරීමට ඔහුට හැකියාව ලැබිණ. ඉතිහාසයේපලමු වරට ශ්‍රී ලංකා භූමිතලයේ සියලුම පස්වර්ගයන්හි සුවිශේෂ විස්තර ඇතුලත් පාංශු සිතියම නිමවූයේ ඔහුගේ ප්‍රධානත්වයෙනි. මේ කාර්ය සඳහා දිවයිනේ සෑම ප්‍රදේශයකටම යෑම තුලින් දිවයිනේ විවිධ ප්‍රදේශවල සිටින ගොවිජනතාවගේ ප්‍රශ්න පිළිබඳව මනා අවබෝධයක් ලබා ගැනීමටද හැකිවීයයි ආචාර්ය පානබොක්කේ පවසයි.

# “පර්යේෂණ කටයුතු විද්‍යාගාරයෙන් ගොවි කෙතට”

1970 සිට වසර පහක් ජාතියේ උදර කාර්යයකට උර දෙන්නට ඔහුට වාසනාව ලැබුනේය. ඒ මහවැලි ජනාවාස ව්‍යාපාරයේ මූලික සැලකිල්ල සකස් කිරීමටයි. අනතුරුව පර්යේෂණ භාර නියෝජ්‍ය කෘෂිකර්ම අධ්‍යක්ෂ ධූරයට ඔහු පත්වීම නව පර්යේෂණ මාර්ගයකට අවතීර්ණ වීමක් විය. මේ මහා පෙරළියට මුල් පිරූ අදහස ආචාර්ය පනාබොක්කේ විස්තර කලේ මෙලෙසිනි. “ මා තරුණ අවධියේදී පර්යේෂණ කරද්දී ඇතිවූ අදහසක් තමා පර්යේෂණ වලින් ලබා ගන්නා දැනුම ගොවිමහතුන් ගේ දැනුමට එක්කිරීම.නැත්නම්අපේ ගොවි මහත්වරුන්ගේ දැනීමට අනුකූලව පර්යේෂණ කිරීම.

මෙයට හේතුවුනේ පෙර කාලයේ පර්යේෂකයන් හා ගොවිජනතාව අතර විශාල පරතරයක් තිබීමයි පර්යේෂණාගාර වලටවී කරන පර්යේෂණ ගැන විමසුවාම ‘තමුසෙට මේක තේරෙන්නේ නැතැයි’’ කියන පර්යේෂකයනුත් සිටියා. මෙයට තවත් හේතුවක් තිබුනා ඒ වන විට කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ව්‍යාප්ත අංශය ඉතා දියුණුවී තිබුනා එනිසා ගොවීන්ට බලපාන ප්‍රශ්න වලට විසඳුම් සෙවීමට පර්යේෂණ කරන ලෙස ව්‍යාප්ත අංශයෙන් ඉල්ලුමක් ඇතිවුනා.

මේ අරමුණු ඉටු කරමින් කරන ලද පර්යේෂණ නිසා, මෙරට කෘෂිකර්මයේ ගොවිජනතාවගේ දියුණුවට වූ සේවාවට අමතරව තවත් සේවයක් කෘෂි පර්යේෂණවලට සිදුවුනා. ඒ මෙතෙක් කල් පර්යේෂණාගාරවල විශාල වියදමකින් කරනලද පර්යේෂණ ගොවිපලේදී අඩුවියදමකින් කරන්නට හැකිවීමයි. ඒ සමගම අපේ ගොවි මහත්වරුන්ද පර්යේෂණවලට හවුල් කරගත හැකිවුනා මේ පිළිබඳ උදාහරණයක් අපේ ගොවි මහතුන් කුඹුරු වර්ග දෙකකට පමණයිබෙදා තිබුනේ. ඒ ගොඩ කුඹුර හා මඩ කුඹුර යන නමින්. ගොඩත් නොවන මඩත් නොවන කුඹුරක් ගැන ඔවුන් තැකුවේ නැත. කෘෂිකර්මයේදී වැදගත් තැනක් උසුලන මේ කුඹුර අපි මැද කුඹුර යන නමින් හැඳින්වූවා. මෙලෙසින් පාංශු පලපාලනය, ගොඩ ගොවි තැන වැනි ක්ෂෙත්‍රවලටද මෙම පර්යේෂණ විහිදී ගියා.’’

මෙම කාලය තුළදී සිදුවූ තවත් වැදගත් සේවාවක් නම කෘෂිකර්ම පර්යේෂණ ව්‍යාප්ත හා පුහුණු අංශ චක්‍රයක සේ අත්වැල් බැඳ ගැනීමයි. එමගින් ව්‍යාප්ත සේවා වලදී මතුවන ප්‍රශ්න පිළිබඳව පර්යේෂණ කර ඒ අනුව පුහුණු කිරීම තුලින් ව්‍යාප්ත කටයුතු දියුණු කිරීමට හැකියාව ලැබිණ. මේ කටයුත්ත කිරීමට හැකිවූයේ ආචාර්ය අබේරත්න මහතා විසින් ව්‍යාප්ත අංශය ඉතා දියුණු තත්වයකට පත්කර තිබීමයි.

“ආචාර්ය අබේරත්න සිය ජීවිතයට ඉතා හිතකර බලපෑමක් හා විශිෂ්ට සේවාවක් කළ පුද්ගලයෙකු ලෙස හැඳින්වූ පනාබොක්කේ මහතා නිහඬ සේවාවක් කළ ආචාර්ය අබේරත්න බොහෝදෙනෙකුට සිය සේවය සෙසු නිලධාරීන්ගේ අභිවෘද්ධියට කැපකල පුද්ගලයෙකු ලෙස ගෞරවයෙන් සැළකිය යුතු බවද කීය. වෙනත් බොහෝ ක්ෂෙත්‍රවල නොමැති විශේෂත්වයක් කෘෂිකර්ම පර්යේෂණ ක්ෂෙත්‍රයෙහි දකගත හැකිය: ඒ පර්යේෂණ මට්ටම තවත් වර්ධනය කරන පර්යේෂණ පරපුරවල් රාශියක් බිහිවීමය “ අපේ රටේ අනාගතය දීප්තිමත් කරන පර්යේෂකයන් ඇතැයි’’ යන්න ආචාර්ය පානබොක්කේගේ අදහසයි.

# "අන්තර් ජාතික බලපෑමට හසුනොවූ අපේ පර්යේෂණ"

අපෙන් ප්‍රශ්නයක් නැගිණ: "ලෝක ප්‍රකට අන්තර් ජාතික කෘෂි පර්යේෂණ ආයතනවල විවේචකයන් පෙන්වා දෙන කරුණක් නම්, එම ආයතන මගින් වැඩි අස්වැන්න ප්‍රමාණයක් ලැබෙන බෝග වර්ග නිපදවූවත් සාමාන්‍ය ගොවි ජනතාවගේ තත්වයට ඉන් පිටුවහලක් නොලැබෙන බවයි?"

"මෙයට හේතු ගණනාවක් තිබෙනවා, එහෙත් කෘෂි පර්යේෂණ අංශයෙන් බලන කල දියහැකි පිළිතුර නම් අපේ කෘෂි පර්යේෂණයන් අන්තර් ජාතික ආයතනයේ බලපෑම් වලට අසුවී නැති බවයි. අපේ පර්යේෂණ සිද්ධාන්තයන් අපේ අවශ්‍යතා වලට අනුකූලවයි. අනෙක් අතින් යම් නව භෝගයකින් අස්වැන්නේ සියයට 75ක් ලැබුණොත් ඒ කියන්නේ බුසල් සීයයක් ලැබෙන වී වර්ගයකින් බුසල් 75 ක් සාමාන්‍ය ගොවියෙකුට නිපදවිය හැකි නම් එය ප්‍රමාණවත්ය"

මේ රටේ කෘෂික්ෂේත්‍රය පිළිබඳව අදහස් දක්වූ පානබොක්කේ මහතා "තිරිඟු හැර අපේ අනෙක් සියලුම ආහාර අවශ්‍යතා මෙහිම වගා කර සපුරාගත හැකියි. මේ අනුව වී වලට අමතරව අනෙත් ආහාර වර්ග වැවීම පිළිබඳ සාර්ථක පර්යේෂණ දැන් පැවැත්වෙනවා

අපේ රටේ ප්‍රධානතම සංවර්ධන යෝජනා ක්‍රමය පිළිබඳව විමසන ලදුව "කඩිනම් මහ වැලි ව්‍යාපාරය මේරටේ අතිවිශිෂ්ඨ යෝජනා ක්‍රමයක් ලෙස සැළකිය හැකියි. විශේෂයෙන් මෙරටට අවශ්‍ය බලශක්තිය ලබාදීමේ ක්‍රියාවලියේදී එයින් ඉමහත් සේවයක් ඉටුවෙනවා

එහෙත් කෘෂි පනාවාසකරනයේදී එය එතරම් කඩිනම් කළ හැකිද යන්න ප්‍රශ්නයක් මගේ අත්දැකීම අනුව අවුරුද්දකට ඒ අංශයෙන් කළ හැක්කේ අක්කර 15,000 ක් පමණයි. මහවැලියෙන් අස්වද්දන නව ඉඩම් අක්කර 3,00,000 සඳහා සෑහෙන කලක් ගතවෙනු ඇත. එය ජීව විද්‍යාත්මක ක්‍රියාවක් නිසා එය වේගවත් කළ හැකි නොවේ."

කෘෂි රසායනික භාවිතය පිළිබඳව තුනාවන ලෝකයේ රටවලින් විශාල ලෙස විරෝධය නැගෙමින් පවතින හෙයින් ඒ පිළිබඳව අදහස් විමසූවිට "අපේ රටේ බොහෝ ක්ෂේත්‍රවල කෘෂි රසායනික භාවිතා කරන්නේ ඉතා පරිස්සමින්. විධිමත් පාලනයක් අතිව සමහර අවස්ථාවලදී එළවළු වගාවේදී හැපැණුවිට, සෑම ගොවිතැනකදීම පාහේ රසායනික ද්‍රව්‍ය භාවිතය අවශ්‍ය පමණටයි සිදුවන්නේ, කෘෂි රසායනික භාවිතය පිළිබඳව අපේ ජනතාවට ඉතා පුහුණුවක් හා අවබෝධයක් තිබෙනවා"

"අපේ රටේ කෘෂිකර්මයේ දියුනුව සඳහා තාක්ෂණික පර්යේෂණවලට, ගොවි කටයුතු පර්යේෂණ හා පුහුනු කිරිමේ ආයතනය වැනි ආයතන මගින් කෙරෙන සමාජ ආර්ථික පර්යේෂණයන්ද පිටුවහල් කංගතහොත් වැදගත් වේයැයිද ආචාර්ය පානබොක්කේ පැවසීය.

"අපේ කෘෂිකර්මයේ තවත් දියුනු කළයුතු අංශ මොනවාද? : ගොවිපල බලය, තාක්ෂණික ක්ෂේත්‍ර, ගොවිතැන් ක්‍රම හා සී නොසා වගා කිරිම වැනි අංශ කෙරෙහි අවධානය යොමු කළ යුතු බවයි ඔහුගේ හැඟීම.

දැන් රජයේ සේවයෙන් විශ්‍රාම ගැනීමට ආසන්නව සිටින මෙම විද්‍යාඥයාගෙන් ඔහුගේ ජීවිතයේ සන්ධ්‍යා භාගය ගතකරන අන්දම අප විමසූවිට සිය පාපුරේ තවත් සම්ප්‍රදයක් අනුව යමින්, මෙරටෙ වැඩදයක තවත් කෘෂි විද්‍යාඥයන් රාශියක් බිහිකිරිමට ඉඩ කඩ සැලසෙන, අධ්‍යාපන කටයුතුවල නිරතවීමට අදහස් කරන බව පැවසීය.

"මෙයට අමතරව, මෙරටේ ගොවිජනතාවගේ සාමාන්‍ය ආර්ථික තත්වය නැංවීමට ආධාරවන තවත් පර්යේෂණ කීපයක නිරත විවිධ අදහස් කරනවා මෙරට ඉතා කුඩා දිවයිනක් වුවත් එහි විවිධ වගාක්‍රම 15ක් තිබෙනා ඉන් 3ක් එනම් තෙත කලාපයේ කුඩා බිම් කට්ටිවල වගා කටයුතු වියලි. කලාපයේ කුඩා වැව් ආශ්‍රිත වගා කටයුතු. හා උඩරට ගෙවතු වන උද්‍යාන පිළිබඳව පර්යේෂණ කිරිම තමාගේ අදහස"

සිය ජීවිත කාලයම මෙරටේ කෘෂිකර්මයේ උන්නතිය සඳහා කැපකල මෙම ඥභා විද්‍යාඥයාගෙන් මෙරටේ කෘෂිකර්මයට තවත් වැඩදයක කාර්යයන් රාශියක් සිදුවේවායි බලාපොරොත්තුවෙන්, 'ගොවිජනතාව" වෙනුවෙන් අපි ඔහුටදීගාසිරි පැතුමෙවමු

සාකච්ඡාව මෙහයවීම:
සරත් දසානන්ද

ඡායාරූප:
රංජිත් දිසානායක

පිටපත:
ගුණරත්න රාමනායක